දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් නිරාකරණ මධ්‍යස්ථානය - කොළඹ
மாவட்ட தேர்தல் பிணக்குதீர்வு பிரிவு - கொழும்பு
**District Election Dispute Resolution Center – Colombo**

16 වන මහල , "නිල මැදුර", ඇල්විටිගල මාවත, කොළඹ 05
16 ஆம் மாடி,"நிலமெதுர",எல்விட்டிகல மாவத்தை, கொழும்பு 05

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>**Mv No** | EDR/PRE/2024/Colombo/05 | ඔබේ අංකය<br>உமது இல<br>**Your No** | | දිනය<br>திகதி<br>**Date** | 2024.09. |

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති
(ප්‍රජා පොලිස්, සංචාරක, ආයෝජන හා මැතිවරණ)
පොලිස් මූලස්ථානය
කොම්පඤ්ඤවීදිය
කොළඹ 02

<u>ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීම - 2024</u>

ඉදිරියේ දී පැවැත්වීමට නියමිත ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීමේ කොළඹ දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් නිරාකරණ මධ්‍යස්ථානය ලෙස පහත සඳහන් ආචාරධර්ම ආරක්ෂා කරමින් කටයුතු කළ යුතුව ඇත.

I. කාර්යය ඉටු කිරීමේ දී විෂය මූලික බව සාධාරණව ඉටු කිරීම
II. ස්වභාවිකව යුක්තියේ මූලධර්ම අනුව ක්‍රියා කිරීම
III. සද්භාවයෙන් ක්‍රියාකිරීම හා රහස්‍යභාවය ආරක්ෂා කිරීම
IV. නීති විරෝධී හෝ දූෂිත කටයුතුවලට ඉඩ නොදීම
V. තොරතුරු අයථා ලෙස භාවිත කිරීම හා අවභාවිත කිරීම වැළැක්වීම
VI. අපක්ෂපාතිව හා විනිවිදභාවයෙන් කටයුතු කිරීම
VII. ගැටුම් සම්බන්ධ කටයුතුවලදී සියළුම පාර්ශ්ව සමග සුහදතාවයෙන් මනා පාරදෘශ්‍යභාවයකින් සහ මනා සම්බන්ධීකරණයකින් 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ පනතට හා මැතිවරණ කොමිෂන් සභාවේ චක්‍රලේඛවලට, නියම හා උපමාන විධානයන්ට අනුකූලව ක්‍රියාකිරීම

02. එසේම උක්ත ආචාරධර්ම ආරක්ෂා කරමින් මැතිවරණය ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව සතියක කාලයක් ගත වන තෙක් වූ කාල පරිච්ඡේදය මැතිවරණ නිරාකරණ මධ්‍යස්ථානයේ කාර්යයන් හා විෂය පථයට ඇතුළත් බැවින් මැතිවරණ දිනට පෙර මෙන්ම පසුව ඇතිවන ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් ද ක්‍රියා කරනු ඇත.

03. තත්වය එසේ වුවද, මේ වන විට සමාජ මාධ්‍ය ජාලවල හා ප්‍රධාන විද්‍යුත් හා මුද්‍රිත ජාලවල ප්‍රචාරණය වන 'මාලිමාවේ සැබෑ අදිටන' යන ටැග් එක යටතේ සුදත්ත තිලක්සිරි මහතා විසින්

ඔහුගේ 'Talk with sudaththa, Suda Creation' යූ ටියුබ් නාලිකාව හරහා ප්‍රචාරය වන කෙටි වීඩියෝ පටය හා මුහුණු පොත හා ජනමාධ්‍ය මගින් විටින් විට ප්‍රචාරය වූ මෙම විකාශනය පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

එම වීඩියෝ පටය මගින්,

I. අපි තොපිලට උඹලට ගහනවා බලාගෙන හිටපල්ලා,
II. අලි ටිකයි, පොහොට්ටුකාරයොයි, ටෙලිෆෝන්කාරයොයි බලාගෙන හිටපල්ලා, මේ ඉන්නේ අපේ රණවිරුවෝ, බලපල්ලා, තොපිලා
III. ජෙනරාල්ලා ටික බලපල්ලා පවුරු පාත්කුඩම්වලට යටවූ ජෙනරාල්ලා ටික බලපල්ලා හිටපු ආමි කමාන්ඩර්ල ටික බලපල්ලා
IV. මල්ලී ගහනවා අනිවාර්යයෙන් බලාගෙන ඉන්න

අපි ගහනවා මරනවා තොපිව

V. ඡන්දෙ දීලා වැඩක් නැහැ. ගනුදෙනු ටිකක් තියෙනවා බේරා ගන්න (සමන්ත විද්‍යාරත්න මයා)
VI. රජය යනු මර්ධන ආයතනයකි ( කේ.ඩී. ලාල්කාන්ත මයා )

4. ඉහත තර්ජනාත්මක වැකිවලින් යමෙකුට බිය ගැන්වීමක්, තැති ගැන්මක් සිදු විය හැකිය. එමෙන්ම මැතිවරණයෙන් හා බිහිසුණු ලේ වැගිරීම් හා දේපළ විනාශ කිරීම් සහිත ප්‍රචණ්ඩ ක්‍රියා සිදු විය හැකිය. එබැවින් මේ පිළිබඳ අප්‍රමාදව ක්‍රියා නොකළ හොත් පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා අති බිහිසුණු ලෙස ව්‍යාප්ත විය හැකි අතර, එම තත්වය දේශීය හා විදේශීය වශයෙන් ඉතාම අපකීර්තියක් ඇතිවීමට හැකියාවක් පවතී.

5. මෙම ප්‍රචාරණය නිසා ඇති විය හැකි තත්වයන්,

I. දැනට දේශපාලන පක්ෂවල ක්‍රියාකාරීන් බියට පත් වීම
II. එක් පක්ෂයක් සඳහා ඡන්ද ප්‍රකාශ කිරීමට බලාපොරොත්තුවන ඡන්ද දායකයින් බියට පත් වී ඡන්දය ප්‍රකාශ කිරීම සිදු නොකිරීම
III. එක් එක් පක්ෂවල නියෝජිතයින් ඡන්ද ප්‍රකාශ කරන ස්ථානවල හා ගණන් කිරීමේ මධ්‍යස්ථානවලින් ඉවත් වීම හෝ ඉදිරිපත් නොවීම

යන තත්වයන් සෘජුව බලපාන අතර මේ සම්බන්ධයෙන් අනුශාංගික කරුණු කාරණා බොහොමයක් සිදු විය හැකිය.

6. එම නිසා ඉල්ලා සිටිනුයේ,

I. සාපරාධී බිය ගැන්වීම්, වෛරී ප්‍රකාශ සිදු කිරීමට එරෙහිව, මීට සම්බන්ධ පුද්ගලයින් අත්අඩංගුව ගෙන නීති මගින් කටයුතු කිරීම

II. ඇති විය හැකි පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමට හැකි උපරිම ක්‍රියාමාර්ග ගැනීම

III. රජයේ ඉහළ නිලතල දරන හා දැරූ පුද්ගලයින්ගේ විශේෂයෙන්ම ආරක්ෂක අංශ නිලධාරීන්ගේ දේපළ හා ජීවිත ආරක්ෂක විධිමත් ක්‍රියාමාර්ග ගැනීම

IV. මීට අමතරව පක්ෂ ක්‍රියාකාරීන්ගේ, දේශපාලඥයින්ගේ දේපළ හා ජීවිත ආරක්ෂාව පිළිබඳ පූර්ණ සැලසුමක් යෙදීම

ඉහත වීඩියෝ පටයට අදාළ යූ ටියුබ් සැබැඳිය - https://youtu.be/w98TQzz-H7Q?si=0rWU3-CeEPfeDCV6

මෙම පැමිණිල්ල telligp@police.gov.lk යන විද්‍යුත් ලිපිනයට යොමු කර ඇත.

එස්.ඒ.එන්.ආර්.සුබසිංහ

ප්‍රධාන සහකාර තේරීම් භාර නිලධාරි

කොළඹ දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් නිරාකරණ මධ්‍යස්ථානය.

දු.ක - 0112050425
ෆැක්ස් - 0112369259
ඊමේල් - **inaudit@moha.gov.lk**

පිටපත:-
01. අතිරේක මැතිවරණ කොමසාරිස්, (නීති හා විමර්ශන) - කාරු.දැ.ගැ.ස.
02. නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් , කොළඹ නාගරික - කාරු.දැ.ගැ.ස.
03. නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් , කොළඹ දිස්ත්‍රික්කය - කාරු.දැ.ගැ.ස.
04. නියෝජ්‍ය පොලිස්පති, ජාතික මැතිවරණ ආරවුල් නි.ම. - අ.ක.ස.